# ආරක්ෂක අමාත්‍යංශය

## ලංසු කැඳවීම

## හෘද සහ උරස් සංකටක දැඩි සත්කාරක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම
## රිජ්වේ ආර්‍යා ළමා රෝහළ කොළඹ - 08
## (ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය සැපයිම සහ ස්ථාපනය කිරිම)

## කොන්ත්‍රාත් අංකය : MOD/SLN/03/2023

1. **රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද සහ උරස් සංකටක සත්කාර සංකීර්ණයේ ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය සැපයිම සහ ස්ථාපනය කිරිම** සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ හි ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සභාපතිතුමා වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනා නිකුත් කෙරේ. ඇස්තමේන්තුගත මුදල **රුපියල් මිලියන තුන්සිය අසූ හයකි (රු.මි. 386)** (අවිනිශ්චිතතා සහ බදු හැර). නිමකිරීමේ කාලය ලිත් දින 180 කි. ඉදිකිරීම් පරිශ්‍රය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහල පරිශ්‍රයේ පිහිටා ඇත.

2. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටියට (NCB) අනුව ලංසු තැබීම සිදු කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛන ගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

   අ) ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) **ගිනි හඳුනා ගැනිම, ආරක්ෂණය කිරිම සහ මර්ධනය කිරිම (FDPS) EM -1** ශ්‍රේණිය සඳහා ලියාපදිංචි වී තිබිය යුතුයි.

   ආ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් **රුපියල් මිලියන 700** ක් විය යුතුය.

   ඇ) තිබිය යුතු අවම ද්‍රවශිල වත්කම් සහ / හෝ ව්‍යාපෘති නිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳිම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර **රුපියල් මිලියන 150** විය යුතුය.

   ඈ) පසුගිය වසර පහ තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් සමාන ස්වභාවයකින් හා සංකීර්ණත්වයකින් යුතු ගොඩනැගිලි ව්‍යාපෘතියක් සඳහා ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය ඉදිකිරීමේ පළපුරුද්ද.

   ඉ ) පහත සඳහන් කාර්යය මණ්ඩලය ද කොන්ත්‍රාත්කරු සතු විය යුතුය.

   - යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - අර්ධ කාලින) - විද්‍යාවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 2ක පළපුරුද්ද

   - සහයක යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - පූර්ණ කාලින) - ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / උසස් ජාතික ඩිප්ලෝමාව (HND) / පූර්ණ කාලින සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතික පාඨමාලාව (NDES) හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 3ක පළපුරුද්ද.

4. අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් 31/07/2023 දින සිට 21/08/2023 දින දක්වා වැඩකරන දිනයන්හි **0900 පැයේ සිට 1500 පැය** දක්වා අතරතුර ප්‍රධාන මූල්‍ය නිලධාරී I කාර්‍යාලය (දෙවන මහල), ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ හිදී ලිඛිත අයදුම්පත්‍රයක් සහ ආපසු නොගෙවන රුපියල් 50,000.00 ක (බදු රහිත) ගාස්තුවක් ගෙවීමෙන් මිල දී ගත හැකිය. මුදල් ගෙවීම මුදලින්ම කල යුතුවේ.

5. ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර සහ ලංසු කැඳවීමේ අදාළ ලේඛන ප්‍රධාන මූල්‍ය නිලධාරී I කාර්‍යාලය (දෙවන මහල), ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනයෙන් 31/07/2023 සිට 21/08/2023 දක්වා ඕනෑම වැඩ කරන දිනයක **0900 පැයේ සිට 1500 පැය** දක්වා මුදල් ගෙවීමකින් තොරව නිරීක්ෂණය කල හැකිය.

| | |
|---|---|
| අධ්‍යක්ෂක ජෙනරාල් ඉංජිනේරු, | දුරකථන අංක – 011 7194211 |
| ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය , | ෆැක්ස් – 011 2441456 |
| තැ.පෙ. 593, | විද්‍යුත් තැපැල - nhqdge@gmail.com |
| කොළඹ 01, | |

ලංසු 18/12/2023 දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 119ක්) වලංගු විය යුතුය.

6. ලංසු ඇපකරය, **රුපියල් 5,800,000.00** වටිනා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් වියයුතුය.

7. අදාල ලංසු ඇපකරය 15/01/2024 දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 147 ක්) වලංගු විය යුතුය.

8. මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් 11/08/2023 වන දින 110**0 පැය**ට කොළඹ 08 රිජ්වේ ආර්යා ළමා රෝහලේ දී පැවැත්වේ. ඒ සඳහා පැමිණීමට බලාපොරොත්තු වන ලංසු කරුවන් 10/08/2023 වන දින 1600 පැයට පෙර slnavylrh@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට අදාල නියෝජිතයන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ලබා දීමට කටයුතු කල යුතුයි.

9. ලංසු මුල් පිටපත හා දෘඩ පිටපත (Hard Copy) එකකින් (01) ඉංග්‍රීසි බසින් සම්පූර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන 22/08/2023 වන දින 1100 **පැය**ට හෝ ඉන් පෙර ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කල යුතුය. ලංසු ඇසුරුම් වල පිටත ලිපි කවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංක පැහැදිලිව සටහන් කල යුතුය.

10. නියමිත දිනට නොලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම ලංසු කැඳවීම අවසන් වූ වහාම 22/08/2023 දින 1100 පැයට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. ලංසුකරු හැර ඔහුගේ නියෝජිතයකු සහභාගි වන්නේනම් ලංසුකරුගේ අනුමැතිය ලත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ලංසුකරු විසින් ටෙන්ඩර් විවෘත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින තුනකට පෙර ටෙන්ඩර් විවෘත කිරීම සඳහා සහභාගිවන පුද්ගලයාගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී I කාර්යාලය (දෙවන මහල), ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ. වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ද ලංසුකරුට උපදෙස් දෙනු ලැබේ.

11. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිලිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) සතු වේ.

12. මෙම පුවත්පත් දැන්විම ශ්‍රී ලංකා නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk සහ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය www.defence.lk මගින්ද නිරික්ෂණය කල හැක.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන මූල්‍ය නිලධාරි I කාර්යාලය (දෙවන මහල),**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටෙ.